**නින්දවූර් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 05 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 දෙසැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට නින්දවූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාවට වෙන්කරනු ලැබූ සංවර්ධන ආධාර යටතේ 2016 වර්ෂයේදී ඉදිකර සභාවට භාරදෙනු ලැබූ වාහන නැවතුම්පොළේ වටිනාකම වන රු.1,000,000 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) කාර්යාලීය ලී බඩු 64 ක් 2015 දෙසැම්බර් 22 දින වෙන්දේසි මඟින් රු.52,750 කට විකුණා තිබූ නමුත් ඒවායේ පිරිවැය ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි.

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථාන මාරු වී ගිය සහ සේවය හැරගිය සේවකයින් 25 දෙනෙකුට ප්‍රාදේශීය සභාව විසින් ලබාදුන් ණයවල හිඟ ශේෂය වන රු.141,374 ක් වර්ෂ 09 කට අධික කාලයක සිට අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

(ආ) වර්ෂ 22 කට අධික කාලයක සිට ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු විදුලිය පරිභෝජන ගාස්තු රු.2,951,150 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කර නොතිබුණි.

**1.3.3 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතින්වල I පරිච්ඡේදයේ 5 (xii) වන රීතිය ප්‍රකාරව, මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම යනාදී රාජකාරීමය වශයෙන් පවරා තිබුණු නිලධාරීන් තිදෙනෙකුගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 8,731,248 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,470,047 ක් ව තිබූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 261,201 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 දේපළ බදු අයකිරීම**

සභාවේ බල ප්‍රදේශයට අයත් ප්‍රදේශයේ දේපළ හිමියන් 15,650 දෙනෙකු පදිංචි වී සිටියද, සමාලෝචිත වර්ෂයේ දේපළ හිමියන් 842 දෙනෙකුට පමණක් "K" ආකෘති පත්‍ර යවා තිබීම නිසා වර්ෂය සඳහා ඇස්තමේන්තු කර තිබූ රු. 8,548,000 ක දේපළ බදුවලින් රු.1,570,738 ක් පමණක් අයකර ගෙන තිබුණි.

**2.2.2 මස් කඩ බදු මුදල් අයකිරීම**

1980 සිට 2012 වර්ෂ අවසානය දක්වා හිඟ හිටව පැවැති රු.3,173,466 ක මස් කඩ බදු මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ පැරණි කාර්යාල ගොඩනැගිල්ල 2015 ජූනි 30 දින සිට සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රාදේශීය කාර්යාලයට රු.15,000 ක් වන මාසික කුලියකට ලබා දී

තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කුලී මුදල් වූ රු.270,000 ක වටිනාකම 2017 අගෝස්තු 11 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂ අවසානය දක්වා සභාවේ JCB වාහනය ක්ෂේත්‍ර වැඩ සඳහා තනි පුද්ගලයින්ට කුලියට ලබාදීමෙන් අයවිය යුතු රු.530,820 ක කුලිය අයකර ගැනීමට හෝ අදාළ පුද්ගලයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හෝ 2017 අගෝස්තු 11 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සභාවට ලබා දී තිබූ වටිනාකම රු.496,215 ක් වූ කසළ බඳුන් 81 කින්, කසළ බඳුන් 42 ක් 2017 ජුලි 20 දින වන විටත් අදාළ අවශ්‍යතාවය සඳහා භාවිතා නොකර ගබඩාවේ තබා තිබුණි.

(ආ) 2013 වර්ෂයේදී සභාව විසින් මිලදී ගනු ලැබූ රු.299,965 ක් වටිනා කසළ එකතු කිරීමේ මළු (Bags) 35,290 කින් 33,800 ක් ගබඩාවේ අදාළ අවශ්‍යතාවය සඳහා භාවිතා නොකර 2017 ජුලි 31 දින වන විටත් තබා තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ළමා උද්‍යානයට සහ වාහන නැවතුම්පොළට තණකොළ සිටුවීමේ කාර්යයන් සම්පූර්ණ කර ඇති බවට ලේඛන සකස්කර තාක්ෂණික නිලධාරී විසින් සහතික කර ඒ සඳහා රු.144,300 ක මුදලක් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබාගෙන තිබූ නමුත් අදාළ කාර්යය මේ දක්වා ආරම්භ කර නොතිබුණි.

(ආ) ඉහත සඳහන් වැඩසටහන යටතේ සභාව විසින් ළමා උද්‍යානයට සහ වෙරළ උද්‍යානයට වහලක් යෙදීම සඳහා වියන ලද පොල් අතු යුගල 800 ක් එක් යුගලයක් රු.49 බැගින් වන රු.39,200 ක මුදලකට මිලදී ගෙන තිබුණි. එසේ වුවත් විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව එක් පොල් අතු යුගලයක වෙළඳපොල මිල රු.20 ක් බව දක්නට ලැබූ බැවින් රු.23,200 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

4. **පද්ධති හා පාලන**

---------------------

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | **පාලන ක්ෂේත්‍රය** | | **අවධානය යොමු කළ යුතු කරුණු** |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| | | (ii) | නිෂ්කාර්යව පවතින වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |